# හානිපූරණය සඳහා වන කාර්යාලය

# තනතුරු පුරප්පාඩු

2018 අංක 34 දරන පනත මගින් ස්ථාපිත කරන ලද හානිපූරණය සඳහා වන කාර්යාලයේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කෙරෙන සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුර : සහකාර අධ්‍යක්ෂ - තනතුරු සංඛ්‍යාව - 01**

**අධ්‍යාපන සුදුසුකම් -**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විශ්වවිද්‍යාලයකින් කලා / විද්‍යා / වාණිජ හා කළමනාකරණ විෂය ධාරාව යටතේ ප්‍රථම උපාධිය සහ උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය අර්ධ රාජ්‍ය අංශයේ ආයතනයක ප්‍රජා සංවර්ධනය / සමාජ සුභ සාධනය / ජන සමූහ පුනරුත්ථාපනය සම්බන්ධිත විෂයය කාර්යයන්හි වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම.

**වයස් සීමාව -**

අවු. 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**අභ්‍යන්තර අයදුම්කරුවන් -**

අදාළ ක්ෂේත්‍රයෙහි තනතුරක කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ I වන ශ්‍රේණියේ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**වැටුප් කේතය හා වැටුප් පරිමාණය -**

MM 1-1 - රු. 53175-1375X10-1910X15-95579

**02. තනතුර : හානි පූරණ නිලධාරී - තනතුරු සංඛ්‍යාව - 03**

**අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විශ්වවිද්‍යාලයකින් කලා විද්‍යා වාණිජ හා කළමනාකරණ විෂය ධාරාව යටතේ ප්‍රථම උපාධිය සමත් වීම.

**වයස් සීමාව -**

අවු. 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් කේතය හා වැටුප් පරිමාණය -**

MA 3 - 2016 - 32,200-445X10-660X11-730X10-750X5-54960

**03. තනතුර : භාෂා පරිවර්තක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි ) - තනතුරු සංඛ්‍යාව - 01**

**අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක්.

(සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට ද, ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට ද පරිවර්තන කටයුතු කළ යුතුය. දෙමළ භාෂාවෙන් පරිවර්තනය කිරීමේ හැකියාව අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.)

සහ

අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා සඳහා සම්මාන සාමාර්ථයන් හෝ ඊට උසස් සුදුසුකම් ලබා තිබීම.

**වයස් සීමාව -**

අවු. 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් කේතය හා වැටුප් පරිමාණය**

MA3-2016 - 32,200-445X10-660X11-730X10-750X5-54960

**04. තනතුර අභ්‍යන්තර විගණන සහකාර - තනතුරු සංඛ්‍යාව - 01**

**අධ්‍යාපන සුදුසුකම් -**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විශ්වවිද්‍යාලයකින් වාණිජ / ගිණුම්කරණ / මූල්‍ය කළමනාකරණ / ව්‍යාපාරික කළමනාකරණ පිළිබඳ ප්‍රථම උපාධිය ලබා තිබීම.

හෝ

(ආ) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (HNDA) සහතිකය ලබා තිබීම.

**වැටුප් කේතය හා වැටුප් පරිමාණය -**

MA 3 - 2016 - 32,200-445X10-660X11-730X10-750X5-54960

**වයස් සීමාව -**

අවු. 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**05. තනතුර : කළමනාකරණ සහකාර - තනතුරු සංඛ්‍යාව - 03**

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී

i. සිංහල/දෙමළ,

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) කින් සමත් වීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

- පරිගණක වදන් සැකසුම පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදරා තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සහ ශිල්පීය සේවා ගණයෙහි පහත 'ආ', 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

i. සිංහල/දෙමළ,

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) කින් සමත් වීම.

- පරිගණක වදන් සැකසුම පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදරා තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

සටහන් (1) යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණු වීමේ කාල පරිච්ඡේදයක් ඉහත 'ආ' ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික / අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත 'ආ' ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

**වැටුප් කේතය හා වැටුප් පරිමාණය -**

MA 1-1 - 27910-300X10-350X7-495X4-660X20-48540

**වයස් සීමාව -**

අවු. 18 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වෙනත්.**

- මෙම තනතුරු ස්ථිර තනතුරු වන අතර, සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට හිමිකම් ලබයි.
- ඉහත වැටුප්වලට අමතරව රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව සහ විශේෂ දීමනා ගෙවනු ලැබේ.
- රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන් සිය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත්‍ර යොමු කළ යුතුයි.
- සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් පත්වීම් බලධරයා විසින් ගනු ලබන තීරණ අනුව සිදු කරනු ලබයි.

අයදුම්පත් 'අධ්‍යක්ෂ ජනරාල්, හානි පූරණය සඳහා වන කාර්යාලය, අංක 40, බුත්ගමුව පාර, රාජගිරිය' යන ලිපිනයට 2024.03.05 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. අසම්පූර්ණ හෝ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සටහන් කළ යුතුයි.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**හානිපූරණය සඳහා වන කාර්යාලය,**
**අංක 40, බුත්ගමුව පාර, රාජගිරිය.**
2024-02-14